සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | **ශිල්ප කලා - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි:

- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ලබා දී ඇති වරණ අතුරින් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර සහිත වරණය තෝරා ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ **(X)** ලකුණ යොදන්න.

---

01. ජනයාගේ විවිධ අවශ්‍යතා සිතුම් පැතුම් මුල් කරගෙන ජන කලාව බිහි වී ඇත. ජන කලාවන් කොටස් දෙක වන්නේ,
    (1) ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා
    (2) ජන කලා, විදග්ධ කලා
    (3) ජන කලා, දෘශ්‍ය කලා
    (4) ජන කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා

02. විවිධ වූ වෘත්තීන් සමඟ ජන කලාව බැඳී ඇත. මේ අතරින් ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවන්ට උදාහරණ වන්නේ,
    (1) ගොයම් කවි, පැල් කවි
    (2) මැටි කර්මාන්තය, පිත්තල කර්මාන්තය
    (3) වන්නම්, ශාන්ති කර්ම
    (4) බඹර කවි, සොකරි නාට්‍ය

03. ස්වභාවිකව පොළොවෙන් ලබා ගන්නා මැටි විවිධ ක්‍රමවලට පදම් කර භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබයි. මැටි නිධි ප්‍රධාන වශයෙන් පිහිටා ඇති ප්‍රදේශ වන්නේ,
    (1) මොළගොඩ (2) මහනුවර (3) අම්බලන්ගොඩ (4) දකුණු පළාතේ

04. පිය පුතු උරුමයක් වන ලාක්ෂා කර්මාන්තයේ වර්තමානය වන විට එම ශිල්පීන් අල්පව දක්නට ලැබේ. ලාක්ෂා නිපදවීමට යොදා ගනු ලබන්නේ,
    (1) ලාක්ෂා කෘමියාගේ ලාටු
    (2) ලාක්ෂා ශාක මගින්
    (3) ලාක්ෂා කෘමියාගේ යුෂ
    (4) ලාක්ෂා කොළ මගින්

05. විනෝදය මෙන් ම සෞභාග්‍ය උදාකරලීම හේතු කොට වෙස් මුහුණු කර්මාන්තය බිහි විය. වෙස් මුහුණු සඳහා යොදා ගන්නා දැව විශේෂයක් වනුයේ,
    (1) රුක් අත්තන (2) පිහිඹියා (3) තලකිරියා (4) කැප්පෙටියා

06. විවිධ විශේෂිත වූ කොළ වර්ග යොදා ගනිමින් මෙන් ම අලංකාර රටා මවමින් කෙරෙන කර්මාන්තයක් වනුයේ,
    (1) බීරලු රේන්ද කර්මාන්තය
    (2) වෙස් මුහුණු කර්මාන්තය
    (3) පන් පැදුරු කර්මාන්තය
    (4) පේෂ කර්මාන්තය

07. මේ වන විට දේශීය නිෂ්පාදන අප අතරින් ගිලිහෙමින් පවතී. ජන කලාවන් සුරැකීමට රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ගයක් නොවන්නේ,
    (1) ප්‍රදර්ශන පැවැත්වීම
    (2) ජනකලා නිර්මාණ ජනපද පිහිටු වීම
    (3) දැනුවත් කිරීම් සිදු කිරීම
    (4) විවිධ ස්ථානවල වෙළඳාම් කිරීම

08. රේඛා හා සංකේත රාශියකින් සමන්විත වූ ජ්‍යාමිතික ඇඳීම ප්‍රධාන වශයෙන් ආකාර දෙකකි. එනම්,
    (1) ඝන ජ්‍යාමිතිය, රේඛා
    (2) තල ජ්‍යාමිතිය, ඝන ජ්‍යාමිතිය
    (3) වෘත්ත, ඝන වස්තු
    (4) තල ජ්‍යාමිතිය, තල රූප

Past Papers Wiki

09. විවිධ ජ්‍යාමිතික නිර්මාණ සිදු කිරීම සඳහා විවිධ වූ රේඛා වර්ග යොදා ගනු ලබයි. මේ අතරින් ප්‍රධානතම රේඛා යුගලය වනුයේ,

(1) සිරස් රේඛා, තිරස් රේඛා (2) සරල රේඛා, වක්‍ර රේඛා

(3) සරල රේඛා, ආනත රේඛා (4) සරල රේඛා, අඛණ්ඩ රේඛා

10. ජ්‍යාමිතික නිර්මාණයේ දී යොදා ගන්නා රේඛා වර්ග ස්ථානය අනුව වෙනස් වේ. මේ අතරින් වස්තුවක පෙනෙන දාර දැක්වීමට යොදා ගනු ලබන්නේ,

(1) සිහින් දාම රේඛා (2) ඝන අඛණ්ඩ රේඛා (3) කඩ රේඛා (4) ඝන අඛණ්ඩ රේඛා

11. වෘත්තයක් තුළ විවිධ වූ කොටස් දැක ගත හැකිය. ඒ අතරින් පහත වෘත්තයෙහි අඳුරු කර ඇති කොටස හඳුන්වනු ලබන්නේ,




(1) පරිධිය (2) කේන්ද්‍රික ඛණ්ඩය

(3) අර්ධ වෘත්තය (4) වෘත්ත පාදය

12. අරය 6cm වෘත්තයක් ඇඳ එම අරය වෙනස් නොකර පරිධිය වටා චාප කැපීම තුළින් එම වෘත්තය කොටස් කීයකට බෙදිය හැකි ද?

(1) 4 (2) 8 (3) 12 (4) 6

13. පාද හතරකින් සමන්විත වූ තල රූපය චතුරස්‍රය නමින් හැඳින්වේ. පහත රූපයෙහි දැක්වෙන්නේ,



(1) ත්‍රිපිසියම (2) රොම්බසය

(3) ආයත චතුරස්‍රය (4) රොම්බාභය

14. කුහර සහිත වස්තුවක් එකම තලයකට දිග හැරිය විට එම රූපය හඳුන්වනු ලබන්නේ,

(1) සමචතුරස්‍රය (2) සෘජුකෝණාස්‍රය

(3) ආයත චතුරස්‍රය (4) විකසනය

15. අතීතයේ ස්වභාවික අමු ද්‍රව්‍ය යොදා ගනිමින් වර්ණ සකසා ඇති අතර සුදු වර්ණය ලබා ගත් ස්වභාවික අමුද්‍රව්‍ය වනුයේ,

(1) අඳුන් දැලි (2) සාදිලිංගම් (3) නිල් අවරිය (4) මකුළු මැටි

16. අතීතයේ සිවුරු පඩු පෙවීම සඳහා කොස් ලී අරටුවලින් වර්ණ සකසා ගෙන ඇත. පසුව එම වර්ණ තහවුරු කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ,

(1) කහ (2) කොස් කොළ (3) බෝම්බු කොළ (4) මරතෝන්ඩි කොළ

17. වර්ණ සංකලනයේ දී ඒ පිළිබඳ අවබෝධය ඉතාමත් වැදගත් වේ. ඕනෑ ම වර්ණයක් ලා පැහැ ගැන්වීමට යොදා ගනු ලබන්නේ,

(1) සුදු වර්ණය (2) රෝස වර්ණය (3) කහ වර්ණය (4) ලා වර්ණ

18. රෙදි නිෂ්පාදනයේ දී ස්වභාවිකව මෙන් ම බාහිරින් ද විවිධ අපද්‍රව්‍ය එක් වේ. මෙම අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

(1) කැඳහරණය (2) මළහරණය (3) විරංජනය (4) කාබනිකරණය

19. පෙර පිරියම් ක්‍රියාවලියේ දී කැඳහරණය මගින් සිදුවන මූලික ක්‍රියාවලිය වන්නේ,

(1) නූලට ශක්තිමත් බවක් ලබා දීම (2) නූලේ අපද්‍රව්‍ය ඉවත් කිරීම

(3) නූලට ලිහිල් බවක් ලබා දීම (4) නූලෙහි පැහැය වෙනස් කිරීම

20. අච්චු සෑදීමේ දී දූව වර්ග තෝරා ගැනීමේ දී ඉතාමත් සැලකිලිමත් විය යුතු ය. එම දූවවල තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

(1) නොදිරන දූව වර්ගයක් වීම. (2) රළු දූව වර්ගයක් වීම

(3) ඇද නොවන දූව වර්ගයක් වීම (4) පහසුවෙන් සොයා ගත හැකි දූව වර්ගයක් වීම

21. අච්චු මුද්‍රණ ක්‍රියාවලියෙහි වාසි රාශියක් පවතී. ඒ අතරින් ප්‍රධානතම වාසියක් වන්නේ,

(1) සායම් අපතේ නොයෑම (2) එකම ආකාරයට මුද්‍රා තැබීම

(3) කාලය වැඩියෙන් වැය වීම (4) පහසුවෙන් අච්චු සැකසීම

22. රෙදිපිළි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පෙහෙකම් කෙඳි අත්‍යවශ්‍යම වේ. කෙඳි වර්ග කළ හැකි ප්‍රධාන ක්‍රම දෙක වන්නේ,

(1) ශාකමය කෙඳි, සත්වමය කෙඳි (2) ස්වාභාවික කෙඳි, කෘත්‍රිම කෙඳි

(3) ස්වාභාවික පොලිමර, කෘත්‍රිම පොලිමර (4) ශාකමය කෙඳි, ඛනිජමය කෙඳි

23. කපු වචන රටවල් අනුව කපු වර්ග නම් කෙරේ. මේ අතරින් උසස් ම කපු වර්ගය වනුයේ,

(1) මිසර කපු (2) ඇමරිකන් උස් බිම් කපු

(3) සී අයිලන්ඩ් කපු (4) ඉන්දියන් කපු

24. කෙඳි වර්ග හඳුනා ගැනීම සඳහා විවිධ පරීක්ෂණ සිදු කරයි. පිලිස්සුම් පරීක්ෂාවේ දී කුඩා අළු ගුලි සෑදෙන්නේ මින් කුමන කෙඳි වර්ගයේ ද?

(1) ලෝම (2) කපු (3) ලිනන් (4) සේද

25. ඛනිජ කෙඳිවලින් පුනර්ජනිත කෙඳි ලෙස හඳුන්වනු ලබන්නේ මේ අතරින් කුමන කෙඳි වර්ගය ද?

(1) සංශ්ලේෂිත කෙඳි (2) කෘත්‍රිම සේද (3) ඛනිජ කෙඳි (4) අර්ධ කෘත්‍රිම කෙඳි


26. වාම් වියමන් ක්‍රමයට අයත් වියමනක් නොවන්නේ,

(1) වාම් වියමන (2) මී වද වියමන (3) හීරි වියමන (4) සැටින් වියමන

27. දික් හරස් නූල් අතර බැඳීම විවීමේ රටා නම් වේ. ප්‍රධාන වියමන් රටා ඇතුළත් ඛණ්ඩය තෝරන්න.

(1) වාම්, ජටා, හීරි (2) වාම්, හීරි, සැටීන් (3) වාම්, ජටා, සැටින් (4) වාම්, හිරි, සැටින්

28. වාම් වියමනෙහි ප්‍රභේද හතරක් ඇත. ඒ අතරින් පහත රූපයෙන් දැක්වෙන වියමන් රටාව හඳුන්වනු ලබන්නේ,



(1) වාම් වියමන

(2) හරස්දාර වියමන

(3) ජටා වියමන

(4) දික්දාර වියමන

29. ෆෙල්ස්පාර් නම් මාතෘ පාෂාණය දිරාපත් වී මැටි සෑදේ. මැටිවල විද්‍යාත්මක නාමය ඇතුළත් වරණය වනුයේ,

(1) $Al_2O_32SiO_2(2H_2O)$ (2) $Al_22SiO_22H_2O$

(3) $K_2OAl_2O_36SiO_2$ (4) $Al_2O_3SiO_2H_2O$


30. මැටි යනු දිරාපත් වූ පාෂාණ කොටස් වේ. මැටි සෑදීමට පාෂාණ ජීරණය විය යුතු කලීලමය අංශු ප්‍රමාණය වන්නේ,

(1) 0.2 (2) 0.02 (3) 0.002 (4) 0.002

31. විවිධ ක්‍රම අනුව මැටි වර්ග කෙරේ. ජීරණය වූ ස්ථානයේ ම තැම්පත්වන මැටි හඳුන්වනු ලබන්නේ,
(1) ද්වතියික මැටි (2) ප්‍රාථමික මැටි (3) බෝල මැටි (4) රතු මැටි

32. මහාපරිමාණ කර්මාන්තශාලාවල දී යන්ත්‍රානුසාරයෙන් මැටි පදම් කිරීම සිදු කරයි. සියුම්ව කුඩු කර ගැනීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර වර්ගය වනුයේ,
(1) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය (2) ජෝ ක්‍රෂර් යන්ත්‍රය
(3) බෝල් මීල් යන්ත්‍රය (4) පග්මීල් යන්ත්‍රය

33. මැටි මගින් විවිධ ආකාරයේ භාණ්ඩ නිපදවනු ලබයි. පහත භාණ්ඩය නිපදවා ඇත්තේ,




(1) අච්චු භාවිතයෙන් (2) අතින් ඇඹීමෙන්
(3) මැටි දරණු භාවිතයෙන් (4) මැටි තහඩු භාවිතයෙන්

34. මැටි තහඩු කැටයම් කිරීමේ විවිධ ක්‍රම පවතී. මේ අතරින් මැටි තහඩුවක් මදක් හැරීමෙන් මතුකර ගන්නා කැටයම් හඳුන්වනු ලබන්නේ,
(1) අධි උන්නත කැටයම් (2) අල්ප උන්නත කැටයම්
(3) සීරුම් ක්‍රම කැටයම් (4) අර්ධ උන්නත කැටයම්

35. ගෘහ අලංකරණ සඳහා විවිධ ක්‍රම භාවිතා කරයි. මේ අතරින් රෙදි කැබලි කිසියම් රටාවකට ගොනුකර මැසීම හඳුන්වනු ලබන්නේ,
(1) පාපිසි මැසීම (2) නෙට්වර්ක්
(3) පැච්වර්ක් (4) හීට් ඇන්ඩ් බොන්ඩ්

36. පැච්වර්ක් නිර්මාණ සඳහා විවිධ මැහුම් ක්‍රම භාවිතා කෙරේ. පහත රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය හඳුන්වනු ලබන්නේ,



(1) දම්වැල් මැස්ම
(2) හුරුළු කටු මැසීම
(3) ලේසිඩේසි මැස්ම
(4) බ්ලැන්කට් මැස්ම

37. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා අලංකාර මැහුම් ක්‍රම යොදා ගැනේ. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රම ඇතුළත් වරණය වනුයේ,
(1) ලූප් මැස්ම, බ්ලැන්කට් මැස්ම (2) කෙලින් මැස්ම, නැටි මැස්ම
(3) රිබන් මැස්ම, දම්වැල් මැස්ම (4) නැටි මැස්ම, ලේසිඩේසි මැස්ම

38. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා විවිධ වර්ගයේ රිබන් වර්ග භාවිතා කරනු ලබයි. ඒ සඳහා යොදා නොගන්නා රිබන් වර්ගයක් වනුයේ,
(1) පළල රිබන් (2) ෂේඩට් රිබන් (3) සැටින් රිබන් (4) බේබි රිබන්

39. වුල් ගෙතීම විශේෂයෙන් ළදරු ඇඳුම් පැළඳුම් සඳහා භාවිතා කරයි. ගෙතීමට ආධුනික කෙනෙකු මුලින් ම ගොතනු ලබන්නේ,
(1) තනිපට පිරවිල්ල (2) දම්වැල ගෙතීම
(3) කුකුළු ගෙතීම (4) දෙපට පිරවිල්ල

40. ගෙතීම සඳහා විවිධ උපකරණ හා මෙවලම් භාවිතා කරයි. ඉතා පහසුවෙන් ගෙතීම සිදු කළ හැකි උපකරණය වනුයේ,
(1) වුල් ගොතන කටු දෙක (2) තැටින් කටුව
(3) වුල් ගොතන තනි කටුව (4) හර්නල් කටුව

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය

ශිල්ප කලා - II

කාලය පැය 02 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

---

(01) ඩී. එස්. සේනානායක විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය ලබන මස පැවැත්වීමට පාසලේ සංවිධායක මණ්ඩලය තීරණය කර ඇත.

(i) ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණෙන ආරාධිතයන්ට යැවීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක ඉදිරිපස අලංකාර කිරීමට සුදුසු නිර්මාණයක් ඇඳ දක්වන්න.

(ii) සංවිධායක මණ්ඩලය සඳහා සුදුසු ලාංඡනයක් අඳින්න.

(iii) ත්‍යාග ප්‍රදානෝත්සවයට පිවිසීමේ දොරටුව අලංකාර කිරීමට සුදුසු කෘත්‍රිම අමු ද්‍රව්‍ය 2 ක් නම් කරන්න.

(iv) නිවේදන කටයුතු සඳහා සුදානම් කරන කථන පුවරුව සැරසීමට ස්වාභාවිකව භාවිත කළ හැකි ශාක පත්‍ර 2 ක් නම් කරන්න.

(v) පිළිගැනීමේ නර්තනය ඉදිරිපත් කරන නර්තන කණ්ඩායමේ ඇඳුම් නිර්මාණය සඳහා භාවිත කළ හැකි රෙදි පිළි අලංකරණ ක්‍රම 2 ක් නම් කරන්න.

(vi) ත්‍යාගලාභීන් සඳහා පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(vii) ත්‍යාග ප්‍රදානෝත්සවයට සුදුසු තේමාවක් ලියා දක්වන්න.

(viii) ත්‍යාගලාභීන් සඳහා පිරිනමන ත්‍යාග ඇසුරුම් පෙට්ටියක විකසනය ඇඳ දක්වන්න.

(ix) ආරාධිත අමුත්තන් පිළිගැනීමට ලබා දෙන මල් කළඹ සඳහා සුදුසු මල් වර්ග 2 ක් නම් කර මල් කළඹක් ඇඳ දක්වන්න.

(x) උත්සවයේ පොල්තෙල් පහන නිර්මාණය කිරීමට භාවිත කළ හැකි ස්වභාවික අමු ද්‍රව්‍ය 2 ක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) ජන කලාව මිනිසාගේ අවශ්‍යතාවය මත ඉතා ඈත අතීතයේ පටන් පැවත එන්නකි.

(i) ඔබ ජීවත් වන ප්‍රදේශයේ දැකිය හැකි ජන කලාවට සම්බන්ධ දෘශ්‍ය කර්මාන්ත 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජන කලාවේ ප්‍රධාන කොටස් මොනවාදැයි නම් කර ඒවාට උදාහරණ 2 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ ජන කලාවන් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 04)

(03) ජ්‍යාමිතික ඇඳීම රේඛා හා සංකේත රාශියක් සමන්විත වූ විශ්ව භාෂාවකි.

(i) ජ්‍යාමිතික ඇඳීම සඳහා භාවිත කරන උපකරණ 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) 60 mm දිග සරල රේඛාවක් සම කොටස් 7 කට බෙදා දක්වන්න. (ලකුණු 04)

(iii) අරය 3 cm ක් වූ වෘත්තයක් තුළ සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

Past Papers Wiki

(04) රෙදිපිලි අලංකරණයේ දී විවිධ ක්‍රමවේද භාවිත කරයි.

(i) විවිධ අච්චු වර්ග භාවිත කර රෙදිපිලි අලංකරණය කරයි. ඒ අනුව එම අච්චු වර්ග මොනවාද? (ලකුණු 02)

(ii) අච්චු නිර්මාණය සඳහා ඇතැම් විට දැව වර්ග භාවිත කරයි. එම දැවවල තිබිය යුතු ගුණාංග 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අර්තාපල් අලයක් භාවිත කරමින් අච්චුවක් සකස් කර නිර්මාණයක් සිදු කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 04)

(05) රෙදිපිලි නිෂ්පාදනය සඳහා විවිධ කෙඳි වර්ග භාවිත කරයි.

(i) ස්වභාවිකව කෙඳි ලබා ගන්නා ප්‍රධාන ආකාර මොනවාද? (ලකුණු 02)

(ii) ලෝම ලබා ගන්නා බැටළු වර්ග 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) හැඩ පෙත්තක් ඇඳ එහි ලක්ෂණ 2 ක් නම් කරන්න. (ලකුණු 04)

(06) මැටි භාවිත කර විවිධ ශිල්ප ක්‍රම මගින් භාණ්ඩ නිෂ්පාදනය කරයි.

(i) මැටිවල රසායනික හා භෞතික ලක්ෂණ 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මැටි දරණු මගින් භාණ්ඩ සෑදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මැටි දරණු මගින් මල් පෝච්චියක් නිර්මාණය කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න. (ලකුණු 04)

(07) මැටි නිර්මාණය වීම විවිධ හේතු මත සිදුවේ.

(i) මැටි ජීර්ණය වීමට බලපාන ස්වභාවික හේතු 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රාථමික මැටි සහ ද්විතයික මැටි හඳුන්වා නිදසුන් 2 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) මැටි නිධි පිහිටි ස්ථානය අනුව එම කලාප 3 නම් කර ඒවාට අදාළ ප්‍රදේශ 1 බැගින් ලියන්න. (ලකුණු 04)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු පත්‍රය - I කොටස

01. (2)	02. (3)	03. (1)	04. (1)	05. (1)	06. (3)	07. (4)	08. (2)	09. (2)	10. (2)
11. (4)	12. (4)	13. (3)	14. (2)	15. (4)	16. (3)	17. (1)	18. (2)	19. (1)	20. (3)
21. (1)	22. (2)	23. (3)	24. (1)	25. (4)	26. (2)	27. (4)	28. (3)	29. (1)	30. (4)
31. (2)	32. (1)	33. (3)	34. (2)	35. (3)	36. (4)	37. (3)	38. (1)	39. (2)	40. (3)

II පත්‍රය


(01) (i) සුදුසු නිර්මාණයකට ලකුණු ලබා දෙන්න.
(ii) නිර්මාණාත්මක ලාංඡනයකට ලකුණු ලබා දෙන්න.
(iii) සෘජුෆෝම්, ඉටි රෙදි, ප්ලාස්ටික් බට, බැලුන්, කෘත්‍රිම මල්, කොළ ආදී කෘත්‍රිම අමුද්‍රව්‍ය 2 කට ලකුණු ලබා දෙන්න.
(iv) ෆාම්ස්, ඇන්තූරියම් කොළ, ෆර්ම්, ක්‍රෝටන්, මී වන, අල කොළ
(v) අච්චු මුද්‍රණය, පින්තාරු කිරීම, සේද රාමු මුද්‍රණය, සිදුරු තහඩු මුද්‍රණය මේ අතරින් 2 ක්
(vi) සුදුසු ආකෘතියකට ලකුණු ලබා දෙන්න.
(vii) සුදුසු තේමාවකට ලකුණු ලබා දෙන්න.
(viii) සුදුසු ඇසුරුමක විකසනයට ලකුණු ලබා දෙන්න.
(ix) රෝස, ලිලී, ඕකිඩ් ආදී ඕනෑම සුදුසු මල් වර්ග 2 ක් ලියා ඇඳ ඇති රූප සටහනට ලකුණු ලබා දෙන්න.
(x) කෙසෙල් කඳක්, ගොක් කොළ ඇතුළු සුදුසු ඕනෑම අමුද්‍රව්‍ය 2 කට ලකුණු ලබා දෙන්න.

(02) (i) මැටි කර්මාන්තය, පන් කර්මාන්තය ආදී ප්‍රදේශයට ආවේණික කර්මාන්ත 2 කට ලකුණු ලබා දෙන්න.
(ii) ශ්‍රව්‍ය කලා - ගොයම් කවි, පැල් කවි දෘශ්‍ය කලා - වෙස් මුහුණු
කර්මාන්තය, මැටි කර්මාන්තය
ශ්‍රව්‍ය දෘශ්‍ය කලා - වන්නම්, ලී කෙලි
(iii) සුදුසු නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(03) (i) පැන්සල, කවකටුව, කෝණමානය, විහිත චතුරස්‍රය, අඩි රූල ආදි පිළිතුරු 4 ක්
(ii) සරල රේඛාවක් සමාන කොටස් 7 කට බෙදීමේ ශිල්ප ක්‍රමය යටතේ ඇඳ දක්වන්න. (පෙළ පොත 18 පිටුවට අනුව)
(iii) නියමිත ක්‍රම ශිල්ප යටතේ ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (37 පිටුවට අනුව)

(04) (i) ස්වභාවික අච්චු, නිර්මිත අච්චු
(ii) පහසුවෙන් කැපිය හැකි මෘදු දැව වර්ගයක් වීම, පිපිරෙන සුලු නොවීම, කල්පැවැත්ම, ඇද නොවන දැව වර්ගයක් වීම, වර්ණවලට ඔරොත්තු දී මේ හැකියාව
(iii) අර්තාපල් මගින් අච්චුවක් සාදා ගන්නා ආකාරය සහ නිර්මාණයක් සිදු කර ගන්නා ආකාරය අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සමග පියවර ලෙස විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න. (65 පිටුවට අනුව)

(05) (i) ශාක, සත්ත්ව, ඛනිජ
(ii) මැරිනෝ බැටළුවා, දික් ලොම් බැටළුවා, දෙමුහුන් බැටළුවා, මස් බැටළුවා
(iii) ලක්ෂණ,
සමචතුරස්‍රාකාර වීම / මුලු හතර රවුම් හැඩයක් ගැනීම
ශක්තිමත් වීම / නොනැමෙන සුලු වීම
හැඩපෙති මධ්‍යයෙහි 1cm x 1cm ප්‍රමාණයේ හතරැස් සිදුරක් තිබීම
ආදිය ලක්ෂණවලින් 2 ක් ලියා රූපය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.



(06) (i) සවිවරතාවය, හැකිලීම, වර්ණය, සුවිකාර්යතාවය
(ii) * හොඳින් පදම් කළ මැටි භාවිත කළ යුතුය.
* එක සමාන ඝනකම සහිතව දරුනු සකස් කිරීම අවශ්‍යය
* කඩතොළු රහිතව මැටි දරණු සකස් කර ගැනීම
* දරණු එකිනෙක සම්බන්ධ කිරීමේ දී කඩතොළු කර මැටි පාප්ප ගා සම්බන්ධ කළ යුතුවේ.
(iii) මැටි දරණු මගින් මල් පෝච්චියක් සාදා ගන්නා ආකාරය අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සමග පියවර ලෙස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (124-125 පිටු)

(07) (i) සූර්ය තාපය, වර්ෂාව, විදුලි කෙටීම, ආර්ද්‍රතාව, ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය, හිමපතනය, ශාක හා සත්ත්ව ද්‍රව්‍ය ක්‍රියාකාරීත්වය ඉහත හේතු අතරින් 2 කට ලකුණු ලබා දෙන්න.
(ii) ප්‍රාථමික මැටි යනු ජීර්ණය වූ ස්ථානයේම තැම්පත් වන මැටි වේ.
ප්‍රාථමික මැටි - පෝසිලේන් භාණ්ඩ, සෙරමික් භාණ්ඩ, දන්තාලේප බෙහෙත් දවටන, තීන්ත, තාප පරිවාරක උපකරණ, පුයර, පොහොර
ද්විතීයික මැටි යනු ස්වාභාවිකව ප්‍රවාහනය වී වෙනත් ස්ථානයක තැම්පත් වන මැටි වේ.
ද්විතීයික මැටි - උළු, ගඩොල්, රතු මැටි භාණ්ඩ, ජෝරණු උපාංග බිම් ගෙඩොල්, විසිතුරු භාණ්ඩ, වළං, හට්ටි මුට්ටි, ඇතිලි
නිදසුන් 3 බැගින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(iii) තෙත් කලාපීය මැටි නිධි - කැලණි ගඟ, කළු ගඟ, බෙන්තොට, ගිංගඟ
වියළි කලාපීය මැටි නිධි - බංගදෙණිය, අනුරාධපුරය, ඔඩ්ඩුසුඩාන්, ගල් ඔය
[illegible]

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank